දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ 4 /2008

මගේ අංකය :-ප/5/දෙපා:ච:2008
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.
2008.11.17

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ
1. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් හා
2. අංශභාර සියළුම අධ්‍යක්ෂවරුන් වෙත,

## ජල ගාස්තු අවම කරගැනීම.

මෙම දෙපාර්තමේන්තුවේ ජල ගාස්තු සීඝ්‍ර ලෙස වර්ධනය වී ඇති බව පසු ගිය මාස කිහිපය තුළ ලැබුනු බිල්පත් අනුව පැහැදිලි වේ.බොහෝ අවස්ථාවල ජල කරාම විවෘත කර ගොස් තිබූ බවත්, ප්‍රධාන ජල ටැංකියට ජලය යොමු කිරීමේ කරාම වලින් ද ජලය අපතේ ගිය අවස්ථා තිබූ බවත් ආරක්ෂක අංශ වාර්තා කර තිබුණි.

(02). සාමාන්‍යයෙන් මසකට ලීටර 1104000 ක ප්‍රමාණයක ජලය පරිභෝජනය කරන බව පෙනී ගොස් ඇත. ජල පරිභෝජනය සීඝ්‍ර ලෙස පසුගිය වකවානුවේ වර්ධනය වී ඇති බැවින් , ඒ සඳහා මෙම වර්ෂයට වෙන්කර ඇති ප්‍රතිපාදන මේ වන විටත් අවසන් වී ඇත.

(03). මෙම දෙපාර්තමේන්තුවේ ජල පරිභෝජනය අවම කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් යොදා ගැනීම ගැන වරින්වර දැනුවත් කිරීම් කළද, මේ දක්වාම මෙම දෙපාර්තමේන්තුවේ ජල පරිභෝජනය අවම කර ගැනීමට ක්‍රියාකාරී යොමුවීමක් දක්නට නොමැත.

(04). මෙම තත්වය මගහරවා ගෙන මෙම දෙපාර්තමේන්තුවේ ජලය අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීම සඳහා සියලුම නිලධාරීන් ගේ හා සේවක මහත්ම මහත්මීන් ගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීමට ඒ ඒ අංශවල සියලුම නිලධාරීන් පහත සඳහන් කාර්යයන් පිළිබඳව දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

- ජල කරාම භාවිතා කිරීමෙන් පසුව ඒවා ඉතා හොඳින් වසා තැබීමට කටයුතු කිරීම.
- වැසිකිළි පද්ධතිවල ඇතැම් අවස්ථාවල ජල කරාම විවෘත කර දමා ගොස් ඇති අවස්ථා තිබූ අතර, එලෙස ජලය අපතේ යාමේ අවස්ථා වළක්වා ගැනීම.
- ජල කාන්දුවක් දක්නට ලැබුණු අවස්ථාවල නොපමාව එය අළුත්වැඩියා කරවා ගැනීම සඳහා වාර්තා කළ යුතුය.සුළු අළුත්වැඩියාවක් නම් ඔබ අංශයේ සේවක මහතෙකු ලවාම එය නොපමාව ඉටු කර ගැනීම.
- කාර්යාල වේලාව අවසානයේ සියළු ජල කරාම නිසි පරිදි වසා ඇත් ද යන්න ගැන පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු කරන ලෙසට ඔබ අංශයේ කණිෂ්ඨ සේවක මහතෙකුට පවරා දැනුවත් කිරීමට කටයුතු කල යුතුය.

- වාහන සේදීම සම්බන්ධව විධිමත් වැඩ පිළිවෙලක් පරිපාලන අංශය විසින් සකස් කළ යුතුය.
- මෙම කාර්යයන් පිළිබඳව වගකීම පවරා ඇති සේවක මහතුන් ඒ පිළිබඳව දෛනිකව සොයා බලා කටයුතු කරනවාද, යන්න ගැන ඔබ අංශයේ ප්‍රධාන කළමණාකරන සහකාර හෝ සුදුසු නිලධාරියෙකු ලවා පරීක්ෂා කර බැලීම.
- කාර්යාල ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිවල ජල කරාම නිසි පරිදි වසා ඇති බවට ප.ව.4.15 වන විට පවිත්‍රතා සේවයේ සේවකයන්ගෙන් වාර්තාවක් පරිපාලන අංශයට ලබා ගැනීමට ක්‍රියා කිරීම.

(06). ඒ අනුව ඉහතින් අපේක්ෂිත පරිදි කටයුතු කිරීමට සුදුසු පියවර ගන්නා ලෙස දන්වන අතර, ඔබ විසින් ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් ලබා දීමට කටයුතු කරන මෙන් ද කාරුණිකව දන්වමි.

(07). දෙපාර්තමේන්තු වියදම් අවම කර ගැනීම, රජයේ දේපල සුරකීම හා රජයේ මුදල් අරපිරිමැස්මෙන් වැය කිරීම යන කරුණු සැලකිල්ලට ගෙන ජලය සඳහා අධික වියදම් පාලනය කර ගැනීමට සක්‍රීය දායකත්වයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලන අතර, ඒ අනුව ඔබ දක්වන සහයෝගය අගය කොට සලකමි.

එච්.එම්.එස්.පී.හේරත්
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.